සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

# දේශපාලන විද්‍යාව - I

කාලය පැය 02 යි

උපදෙස් :

- **මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් 02 කි.**
- **A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් සමන්විතය.**
- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.**
  **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- අංක 01 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) දේශපාලනය,

(1) සම්පූර්ණයෙන් ම වෘත්තීය චර්යාවකි.
(2) දේශපාලන විද්‍යාවට පූර්වයේ සිට පැවත එන්නකි.
(3) මිනිසාගේ සමාජ හැසිරීමේ සියලු පැතිකඩ පෙන්නුම් කරයි.
(4) විද්‍යාත්මක ව අධ්‍යනය කිරීම නූතන යුගයේ ආරම්භ විය.
(5) දේශපාලනය කිරීම සඳහා දේශපාලනය හදාරා තිබීම පූර්ව කොන්දේසියක් වේ. (......)

(02) දේශපාලන විද්‍යාව

(1) ඉතා පැරණි ශාස්ත්‍රීය ශික්ෂණයකි.
(2) න්‍යාය, සංකල්ප හා අධ්‍යන ක්‍රම ඒකීය ගුරුකුලයකින් ප්‍රභවය ලබා තිබේ.
(3) තේමාවන් සහ අන්තර්ගතය ස්ථිතිකය.
(4) දේශපාලනයේ එක් පැතිකඩයක් පිළිබඳව අධ්‍යනය කරයි.
(5) ස්වාභාවික විද්‍යා විෂය පවුලට අයත් වේ. (......)

(03) දේශපාලන විද්‍යාව සමන්විත වන විෂය ක්ෂේත්‍රය,

(1) සිවිල් සමාජයෙන් පරිබාහිර වූ දේශපාලන පරිමණ්ඩලය පමණක් අධ්‍යනයට බඳුන් වේ.
(2) රාජ්‍යය හා ආණ්ඩුවට සමාජයේ පවත්නා අතිමූලික හා කේන්ද්‍රීය දේශපාලන ආයතන සේ නොසලකයි.
(3) දේශපාලන භාවිත මාධ්‍ය කොටගත් දේශපාලන ආයතන කෙරෙහි දක්වන අවධානය අඩුය.
(4) දේශපාලන දර්ශනය, දේශපාල මතවාද, දේශපාලන න්‍යාය, තුලනාත්මක දේශපාලනය ආදිය මූලික වේ.
(5) දේශපාලනයේ පවත්නා ගතිකත්වයන් සඳහා සංවේදී නොවේ. (......)

(04) රාජ්‍යය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) ඇරිස්ටෝටලියානු අර්ථයෙන් බලගතුම වූ ද වේබේරියානු අර්ථයෙන් උසස්ම වූ ද මනුෂ්‍ය සංවිධානය වේ.
(2) නෛතික පිළිගැනීම වන්නේ ස්වාධිපත්‍ය බලය අනුව සෑම රාජ්‍යයක් ම එක හා සමාන නොවන බවයි.
(3) ගෝලීයකරණය මගින් ජාතික රාජ්‍ය ක්‍රමය ශක්තිමත් වෙමින් පවතී.
(4) ගෝත්‍ර රාජ්‍ය ලොව ප්‍රථම සචේතනික රාජ්‍ය මාදිලිය වේ.
(5) අදෘෂ්‍යමාන, අස්පර්ශීය, අචේතනික ප්‍රපංචයකි. (......)

(05) රාජ්‍ය මාදිලි සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ධනවාදී ආර්ථික ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය මත පදනම් ව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ගොඩනැගී ඇත.
(2) රාජ්‍යයේ මැදිහත් වීමෙන් තොර නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමය සමාජවාදී රාජ්‍යයක මූලික ලක්ෂණය වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම කෙරෙහි ඉහළ පිළිගැනීමක් ෆැසිස්ට්වාදී රාජ්‍ය තුළ දක්නට ලැබේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය සාර්ථකව සිදුවන බව පශ්චාත් යටත්විජිත රාජ්‍ය ආශ්‍රිතව හඳුනාගැනේ.
(5) නව ලිබරල්වාදී රාජ්‍ය මාදිලිය ඔස්සේ රාජ්‍යයේ සුභසාධන සේවා ප්‍රසාරණය වේ. (......)

(06) රාජ්‍යය පිළිබඳව පහතින් දක්වා ඇති න්‍යායික ප්‍රවේශ අතරින් නිවැරදි වන්නේ,

(1) රාජ්‍යය හා පාලකයා දේව නිර්මාණයක් බවට වූ දේවවරම්වාදී මතය නූතන යුගයේ වර්ධනය වූවකි.
(2) සමාජ සම්මුතිවාදයට අනුව රාජ්‍යය පන්තියක ආයුධයකි, ප්‍රජා පීඩක උපකරණයකි.
(3) මාක්ස්වාදයට අනුව අනාගත පූර්ණ කොමියුනිස්ට් යුගයේ රාජ්‍යය ක්‍රියාත්මක නොවේ.
(4) රාජ්‍යය පොදු සමාජ සංවිධානයක් නොවන බව ලිබරල්වාදී මතය වේ.
(5) රාජ්‍යය පිළිබඳව විශේෂ ස්ත්‍රීවාදී න්‍යායයක් පවතී. (......)

(07) සන්ධීය ආණ්ඩුක්‍රමය තුළ

(1) මධ්‍යම ආණ්ඩුව මගින් අවධාරිත කරන ලද බලය සහිත ප්‍රාන්ත ආණ්ඩුක්‍රමයක පැවැත්ම පිළිගනියි.
(2) විවිධත්වය තුළ ඒකීයත්වය ආරක්ෂා කිරීම අරමුණක් වේ.
(3) මධ්‍යයේ බලයට යටත් වූ ප්‍රාදේශීය ආණ්ඩු පවතී.
(4) ලිඛිත හා අනම්‍ය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම අනිවාර්ය නොවේ.
(5) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්විමණ්ඩලික වීම අනිවාර්ය නොවේ. (......)

(08) ජනාධිපති ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය පත්කර ගැනීම.
(2) විධායකය ව්‍යවස්ථාදායකය මත රඳා පැවතීම.
(3) රාජ්‍යයේ නායකත්වය හා ආණ්ඩුවේ නායකත්වය දෙදෙනෙකු විසින් මෙහෙයවනු ලැබීම.
(4) වඩා ස්ථාවර සහ කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයක් බව න්‍යායිකව පිළිගැනීම.
(5) ව්‍යවස්ථාදායකයේ මෙන්ම දේශපාලන පක්ෂවල වැදගත්කම ද ඉහළ නංවයි. (......)

(09) මිශ්‍ර ආණ්ඩුක්‍රමය තුළ

(1) නාමික ජනාධිපතිවරයෙකු සහ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකින් යුක්ත ද්විත්ව විධායකයක පැවැත්මක් ඇත.
(2) අගමැතිවරයා රාජ්‍යයේ මෙන්ම ආණ්ඩුවේ නායකයා වේ.
(3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොසිටී.
(4) විධායකයේ එක් පාර්ශවයක් මහජනතාව විසින් ද පත්කරගනු ලබයි.
(5) වර්තමාන ඉන්දීය ආණ්ඩුක්‍රමයේ පදනමයි. (......)

(10) ලිබරල්වාදය

(1) වැඩවසම් සමාජ, ආර්ථික ක්‍රමයට හා රාජාණ්ඩුවාදී පාලන ක්‍රමයන්ට එරෙහිව 17 සියවසේ අගභාගයේ සිට වර්ධනය වූ මතවාදයකි.
(2) තෝමස් හොබ්ස් පළමු ලිබරල්වාදී චින්තකයා වේ.
(3) රාජ්‍යයේ උත්තරීතරභාවයත්, ශ්‍රේෂ්ඨත්වය හා අසහායභාවයත්, වර්ගවාදයත්, රණවාදයත් පදනම්ව තිබේ.
(4) ආර්ථික සමානාත්මතාවය ගොඩනැංවීමට නම් පොදු දේපල ක්‍රමය ක්‍රියාවට නැංවිය යුතු බව පිළිගනියි.
(5) නිදහස පෞද්ගලික වූවක් නොවන බවත් එය පොදු වූවක් බවත් අවධාරණය කරයි. (......)

(11) සමාජවාදය

(1) නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමය ඉහළින් ම අගයයි.

(2) පෞද්ගලික නිදහස, සමාජ නිදහසේ මුල්ගල බව අවධාරණය කරයි.

(3) ධනවාදය සමාජවාදී මූලධර්ම අනුව ප්‍රතිසංස්කරණය කළ යුතු බව පවසයි.

(4) අත්‍යන්ත රණවාදය මෙන්ම අත්‍යන්ත ජාතිවාදය මගින් ශ්‍රේෂ්ඨ රාජ්‍යයක් ගොඩනැගීමට මග පෙන්වයි.

(5) 19වන සියවසේ ආරම්භ වූ මෙය ලිබරල්වාදයට මෙන්ම ධනවාදයට ප්‍රබල විකල්පයක් ලෙස වර්ධනය විය. (......)

(12) නිරාගමිකවාදය

(1) පුරවැසියා හා ආගම අතර සබඳතාවය ගොඩනැගීම රාජ්‍යයේ වැදගත් කාර්යයක් බව අවධාරණය කරයි.

(2) වැඩවසම්වාදී සමාජ හා දේශපාලන ක්‍රමය අගය කරමින් වර්ධනය වූවකි.

(3) සමභාව්‍ය ලිබරල්වාදයේත් සමාජවාදයේත් චින්තනමය මූලාශ්‍රයක් ද වේ.

(4) ආගමික අයිතිය පුරවැසි අයිතියක් බව සමාජවාදී නිරාගාමිකවාදීන් පෙන්වා දී තිබේ.

(5) ආගම සමාජ පීඩනයේ හා සාවද්‍ය ලෝකයක් නිමවන ආයතනයක් බව ලිබරල්වාදී පිළිගැනීමයි.

(......)

(13) ගැටුම්

(1) ගැටුම් යනු නිරන්තරයෙන්ම නිෂේධනීය ලක්ෂණ පෙන්නුම් කරන සංසිද්ධීන් ය.

(2) ගැටුම් වැළැක්වීමේ එකම ආකාරය සරල වැළැක්වීමයි.

(3) මානව සමාජයේ ඉදිරි ගමනේ ගාමක බලවේගය පන්ති ගැටුම බව මාක්ස්වාදී පිළිගැනීමයි.

(4) ගැටුමේ පාර්ශවකරුවන්, නිමිති හා අරමුණු පරිවර්තනය වීම සහමන්ත්‍රණය ලෙස හඳුන්වයි.

(5) ගැටුම් වැළැක්වීම ඉතා සරළ, කෙටිකාලීන ක්‍රියාවලියකි. (......)

(14) ගැටුම් විසඳීමේ ප්‍රවේශ

(1) මානව අවශ්‍යතා ප්‍රවේශයට අනුව ගැටුමට සම්බන්ධ පාර්ශව අතර සන්නිවේදනය හා අවබෝධය ප්‍රවර්ධනය කළ යුතු ය.

(2) මානව අවශ්‍යතා ප්‍රවේශයට අනුව ප්‍රජා කණ්ඩායම්වල අනන්‍යතාවයන් ආරක්ෂා නොවීම ගැටුම්වලට පාදකවන මූලික සාධකය වේ.

(3) අනන්‍යතා අවශ්‍යතා න්‍යායට අනුව මූලික භෞතික, මානසික, සමාජීය අවශ්‍යතා ඉටුනොවීම ගැටුම්වලට පාදකවන මූලික ම සාධක වේ.

(4) සංස්කෘතික සන්නිවේදන ප්‍රවේශයට අනුව ගැටුමේ නිමිති, න්‍යාය පත්‍ර පරිවර්තනය කිරීම මගින් ගැටුම් අවම කළ හැකි ය.

(5) ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශයට අනුව ප්‍රජාවන් අතර ගැටුම් අවම කිරීම සඳහා ප්‍රජාවන් අතර අවබෝධය දියුණු කළ යුතු ය. (......)

(15) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ මූලිකාංග,

(1) වාර්ගික නියෝජන ක්‍රමය අහෝසිකර පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.

(2) සර්වජන ඡන්දබලය මගින් 61 දෙනෙකුගෙන් යුක්ත රාජ්‍ය මණ්ත්‍රණ සභාවක් පිහිටුවීම.

(3) අගමැතිවරයාගේ නායකත්වයෙන් යුක්ත සාමාජිකයින් 10 දෙනෙකුගෙන් යුක්ත අමාත්‍ය මණ්ඩලය.

(4) විධායක කාරක සභා ක්‍රමය ඔස්සේ පූර්ණ විධායක බලතල ලාංකිකයින්ට පැවරීම.

(5) අධිරාජ්‍ය විරෝධී ක්‍රියාකාරීත්වයක නිරත රාජ්‍ය නිලධාරීන් තිදෙනා (......)

(16) 1833 - කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය
(1) සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
(2) රදළ පංතියට පැවති සමාජ බලය වර්ධනය වීම.
(3) වැඩවසම් ආර්ථික ක්‍රමයේ වර්ධනයට පදනම දැමීම.
(4) උඩුකුරු සමාජ සචලතාවක් ඇති වීම.
(5) ආයාත - නිර්යාත ආර්ථිකයේ බිඳවැටීමක් සිදුවීම. (......)

(17) ශ්‍රී ලංකාවේ යටත්විජිත පරිවර්තනය
(1) යටත් විජිත රාජ්‍යයට උපරිම සුජාත භාවයක් හිමි වේ.
(2) යටත්විජිතකාරකයන් විසින් දේශපාලන, ආර්ථික පරිවර්තනයන්ට බඳුන්කරනු ලැබීය.
(3) විජිතකාරකයාගේ සංස්කෘතිය ලාංකීය සමාජය මත ආරෝපණය කිරීම කිසිසේත් සිදු නොවීය.
(4) ස්වයංපෝෂිත යැපුම් කෘෂි ආර්ථිකය ශක්තිමත් කළේය.
(5) සමාජවාදී සමාජාර්ථික ක්‍රමයකට පදනම දැමීම. (......)

(18) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය,
(1) පාර්ලිමේන්තු ස්වාධිපති බලය සහිත ඒක මණ්ඩලය ව්‍යවස්ථාදායකය
(2) බ්‍රිතාන්‍ය සමග පැවති සියලු ව්‍යාවස්ථාමය බැඳීම්වලින් නිදහස් වීම.
(3) බ්‍රිතාන්‍ය කිරීටය ලංකාවේ රාජ්‍ය නායකත්වය දැරීම.
(4) රාජ්‍ය සේවය දේශපාලන විධායකයේ ග්‍රහණයට ගැනීම.
(5) ශ්‍රේෂ්ඨාධිකරණයට ඉහළම අභියාචනාධිකරණ බලතල පැවරීම. (......)

(19) 1972 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ මූලික ලක්ෂණ,
(1) ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම.
(2) පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ගොඩනැංවූ ජාතික රාජ්‍ය සභාව
(3) ව්‍යවස්ථා විවරණ බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණය
(4) නීතිමය රැකවරණය මගින් සුරක්ෂිත කළ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
(5) ලිබරල් ධනවාදී දේශපාලන හා ආර්ථික මූලධර්ම මත සකස්කළ රාජ්‍ය ප්‍රතිපත්ති මාලාව. (......)

(20) ශ්‍රී ලංකාවේ වෙස්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය,
(1) පළමුවරට හඳුන්වාදෙනු ලැබුවේ 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(2) පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩුක්‍රම ආකෘතියට විකල්පයක් ලෙස වර්ධනය විය.
(3) ජනාධිපති නමින් හඳුන්වන තනි විධායකයකින් සමන්විත වූවකි.
(4) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සමීප සම්බන්ධතාවක් ගොඩනගනු ලැබූ ආණ්ඩුක්‍රමයකි.
(5) රාජ්‍යයේ නායකත්වය මෙන්ම ආණ්ඩුවේ නායකත්වය එක් පුද්ගලයෙකුට හිමිකර දී තිබේ. (......)

- අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

(21) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමය
(A) ආණ්ඩුව හා පාලකයින්ට, ආණ්ඩුකරණය සඳහා නෛතික අයිතිය හා සුජාතභාවය ලබා දෙන්නේ මැතිවරණවලදී ය.
(B) ආණ්ඩුවට හිමි බලය ආණ්ඩුව තුළින් උත්පාදිත වූවකි.
(C) මානව අයිතිවාසිකම් පළමු වරට අනාවරණය කරගත් පුද්ගලයා ලෙස සැලකෙන්නේ ජෝන් ලොක් ය.
(D) ත්‍රිවිධ ආයතනවලට හිමි බලතල එම ආයතන මගින් ම පාලනයට ලක් කිරීම සංවරණ හා තුලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයකි.
(E) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත පදනම්ව පාලනය පවත්වාගෙලන යාමෙන් පමණක් ව්‍යවස්ථානුකූලවාදයක් ඇති නොවේ.

(1) A B C D (2) B C D E (3) A B D E (4) A C D E (5) A B C E (......)

(22) ආණ්ඩුක්‍රම මාදිලි

(A) ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලැයිස්තු 3ක් ඔස්සේ බලය බෙදාහැරීම සඳහන්කර තිබේ.
(B) ලොව ප්‍රථම, ලිඛිත, සන්ධීය, අනම්‍ය ව්‍යවස්ථාව වන්නේ ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
(C) ඉන්දියාවේ පවතින්නේ සමාන්‍ය අවස්ථාවලදී සන්ධීය ලෙස ද විශේෂ අවස්ථාවල ඒකීය ලෙස ද ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමයකි.
(D) ස්විස්ටර්ලන්තය තල තුනක ආණ්ඩුක්‍රමයක් ක්‍රියාවට නංවයි.
(E) බ්‍රිතාන්‍යයේ පවතින්නේ අසමමිතික බලය බෙදීමේ ක්‍රමයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(23) රාජ්‍ය ප්‍රතිපත්ති

(A) මෙයින් සලකා බලන්නේ පොදු ගැටලු ය.
(B) රාජ්‍යයට පැවරුනු වගකීම් ඉටුකිරීමේ මූලෝපායික මාර්ග තීරණය කරයි.
(C) රාජ්‍ය ප්‍රතිපත්තිය ශාස්ත්‍රීයව හැදෑරීම ආරම්භ වූයේ ඉපැරණි ග්‍රීසිය තුළිනි.
(D) මේවා නිර්මාණය කිරීම දේශපාලඥයාගේ කාර්යභාරය බවත් ක්‍රියාවට නැංවීම පරිපාලකයාගේ කාර්යභාරය බවත් සාම්ප්‍රදායික පිළිගැනීම විය.
(E) රාජ්‍ය ප්‍රතිපත්තිය යනු අවධි කිහිපයකින් සමන්විත චක්‍රයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(24) ජාත්‍යන්තර දේශපාලනය

(A) ජාතික දේශපාලනය හා අනන්‍යසම වේ.
(B) වර්තමානයේ බහු ධ්‍රැවීය ලෝක ක්‍රමයක් ක්‍රියාත්මක වේ.
(C) නිරන්තරයෙන් පවතින්නේ අරාජික ස්වභාවයකි.
(D) සමහර රාජ්‍යයන්ටත් වඩා සම්පත් හා ප්‍රාග්ධනය හසුරුවන පාරජාතික සමාගම් ක්‍රියාත්මක වේ.
(E) ප්‍රධානම ක්‍රියාධරයෙක් වන්නේ නිදහස්, ස්වාධිපති ජාතික රාජ්‍යයන් ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(25) අන්තර්ජාතික සංවිධාන

(A) ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භක සාමාජිකයෙකි.
(B) පොදු රාජ්‍ය මණ්ඩලය ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය යටත්විජිත ලෙස පැවතී නිදහස ලැබූ රටවල් සම්බන්ධ වීමෙනි.
(C) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය නිත්‍ය සාමාජිකයින් 05කින් යුක්තවන අතර ශ්‍රී ලංකාව නිත්‍ය නොවන සාමාජිකයෙකු ලෙස කටයුතුකර තිබේ.
(D) ද්වි ධ්‍රැවීය ලෝක ක්‍රමය තුළ මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අරමුණින් නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවාගෙන තිබේ.
(E) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ශ්‍රී ලංකාව ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රකාශය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (26) | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සිංහල භාෂාව මෙන්ම දෙමළ භාෂාව ද මෙරට රාජ්‍ය භාෂාව වන්නේ ය. (......) |
| (27) | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනරජයේ පරමාධිපත්‍ය ජනාධිපතිවරයාට හිමි වේ. | රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය. (......) |
| (28) | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17වන සංශෝධනයේ ප්‍රධාන අරමුණක් වූයේ ජනාධිපති ධූරයේ අධික බලතල සංවරණය කිරීමය. | 18වන සංශෝධනය මගින් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී පාලන මූලධර්ම ශක්තිමත් කර තිබේ. (......) |
| (29) | පූර්ව අධිකරණ විවරණ බලය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙන්ම 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරී ය. | අවසන් අභියාචනාධිකරණ බලය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙන්ම 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීය. (......) |
| (30) | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය මගින් ස්වාධීන කොමිෂන් සභා ක්‍රමයක් ගොඩනැගීමට විධිවිධාන යෙදී ය. | 19වන සංශෝධනය මගින් පිහිටු වූ කොමිෂන් සභා සඳහා සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් නිර්දේශ කර ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබී ය. (.....) |

## B කොටස

31. දේශපාලනය හැදෑරීම යන අදහසට අර්ථ දෙකක් තිබේ. ඒවා මොනවා ද?

(1) ........................................................................................................................

(2) ........................................................................................................................

32. (1) ස්වාධිපත්‍ය බලයේ පරම හිමිකරුවා වන්නේ කුමන ආයතනය ද?

........................................................................................................................

(2) රාජ්‍යයෙන් පරිබාහිරව හා ස්වාධීන ව පුරවැසියන් තම පොදු අරමුණු වෙනුවෙන් සංවිධානය වී සාමූහිකව ක්‍රියාකරන සමාජ අවකාශය කුමන නමකින් හැඳින්වේ ද?

........................................................................................................................

33. 1848 දී කොමියුනිස්ට් ප්‍රකාශනය නම් ග්‍රන්ථය රචනා කළ චින්තකයින් දෙදෙනා නම් කරන්න.

(1) ........................................................................................................................

(2) ........................................................................................................................

34. (1) දේශපාලනය සම්බන්ධයෙන් ප්‍රථම සචේතනික රාජ්‍ය මාදිලිය කුමක් ද?

........................................................................................................................

(2) නිර්ධන පාංතික ආඥාදායකත්වයක් සහිත රාජ්‍ය මාදිලිය කුමක් ද?

........................................................................................................................

35. (1) තනි විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ආකෘතිය කුමක් ද?

.....................................................................................................................................

(2) ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එරට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ආකෘතිය කුමක් ද?

.....................................................................................................................................

36. ලිබරල්වාදයේ

(1) දාර්ශනික ඇඟවීම සහ

(2) දේශපාලනික ඇඟවීම පිළිවෙලින් සඳහන් කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

37. (1) දේශපාලනය හා ආගම එකිනෙකින් දික්කසාද විය යුතු ය. යන අදහස දරන දේශපාලන මතවාදය කුමක් ද?

.....................................................................................................................................

(2) 'දේශපාලනයේ අරමුණ නිදහසයි. එය පුරවැසියන්ට සක්‍රීයව මිසක නිශ්ක්‍රීයව සිටීමෙන් ලබා ගැනීමට හෝ රැක ගැනීමට නොහැකි ය' යන අදහස දරන දේශපාලන මතවාදය කුමක් ද?

.....................................................................................................................................

38. සාමය ගොඩනැගීමේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන අවස්ථාවක් ලෙස ප්‍රතිසංධානගත වීම යන ක්‍රියාවලිය සැලකේ. එම ක්‍රියාවලියේ ප්‍රධාන මට්ටම් තුනක් පවතී. එයින් දෙකක් සඳහන් කරන්න.

(1) .....................................................................................................................................

(2) .....................................................................................................................................

39. (1) ශ්‍රී ලංකාව වැඩවසම් ආර්ථිකයකින් ධනේෂ්වර ආර්ථිකයකට පරිවර්තනය වීම කෙරෙහි පදනම දැමූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

.....................................................................................................................................

(2) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ රාජ්‍ය මණ්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුන් අතරින් හතර දෙනෙකු විධායක කාරක සභා ක්‍රමයට සම්බන්ධ නොවීය. ඉන් එක් අයෙකු වූයේ කතානායකවරයා ය. අනෙක් තිදෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න.

.....................................................................................................................................

40. පහත සඳහන් වන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් පිහිටුවූ ව්‍යවස්ථාදායක සභාවල සංයුතිය පිළිවෙළින් සඳහන් කරන්න.

(1) 1833 - කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය - ..........................................................................

(2) 1920 - පළමු මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය - ..........................................................................

41. පහත සඳහන් ලක්ෂණ ඇතු-ළත් කරමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැංවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මොනවාදැයි පිළිවෙලින් සඳහන් කරන්න.

(1) රාජ්‍ය සේවය හා අධිකරණ සේවය වඩා සමීප ලෙසින් දේශපාලන විධායකය සමග සම්බන්ධ කිරීම.

(2) වඩාත් ස්වාධීන රාජ්‍ය සේවයක් හා අධිකරණ සේවයක් පිහිටුවීමට පියවර ගැනීම.

(1) .....................................................................................................................................

(2) .....................................................................................................................................

42. සෝල්බරි ආණ්ඩු ක්‍රමයට අනුව පිහිටු වූ සෙනෙට් සභාවට මන්ත්‍රීවරුන් 30 දෙනෙකු පත් කළේ ප්‍රධාන ආකාර දෙකකට ය. එම ආකාර දෙක සඳහන් කරන්න.

(1) .....................................................................................................................................

(2) .....................................................................................................................................

43. පුරවැසි සහභාගීත්වය සහ වගවීම් සහතික කිරීම සඳහා මැතිවරණ ක්‍රමය මගින් ආරක්ෂාව කළ යුතු මූලික නිර්ණායක දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

44. (1) ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ විමර්ශන බලය ලබා දී ඇත්තේ සුප්‍රසිද්ධ නඩු තීන්දුවකිනි. එම නඩු තීන්දුවේ නාමය කුමක් ද?

..............................................................................................................................

(2) මහා බ්‍රිතාන්‍යය සමන්විත වන්නේ ප්‍රධාන දේශපාලන ඒකක හතරක එකතුවෙනි. එයින් දෙකක් සඳහන් කරන්න.

..............................................................................................................................

45. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මහජන ගැටලු නිරාකාරණයෙහි ලා විධිමත් අධිකාරී බලය සහිත ආයතන ත්‍රිත්වයක් හඳුනාගත හැකි ය. ඒවායින් දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

46. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දේශපාලන විධායකය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. එම කොටස් දෙක නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

47. (1) "පළමුවරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" නමින් ආයතනයක් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කළේ කී වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ද?

..............................................................................................................................

(2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනයට අනුව අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරුන් සංඛ්‍යාව උපරිම වශයෙන් කොපමණ විය යුතු ද?

..............................................................................................................................

48. (1) ශ්‍රී ලංකාවේ ප්‍රථම නූතන දේශපාලන පක්ෂය කුමක් ද?

..............................................................................................................................

(2) 1970 මහ මැතිවරණයෙන් ආණ්ඩු බලය ලබාගත් දේශපාලන පක්ෂ සන්ධානයේ නම කුමක් ද?

..............................................................................................................................

.49. අන්තර්ජාතික දේශපාලනයේ ක්‍රියාධරයින් ප්‍රධාන කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

50. වර්තමානය වන විට ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යන ජාත්‍යන්තර මූල්‍ය ආයතන දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

# දේශපාලන විද්‍යාව - II

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් -

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- පළමුවැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තුන්වැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. දේශපාලන විද්‍යාව සමන්විත වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20)

02. (i) දේශපාලන පැතිකඩ පිළිබඳව පහදිලි කරන්න. (ලකුණු 10)
    (II) දේශපාලනය හැදෑරීම යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය මාදිලිය සහ සමාජවාදී රාජ්‍ය මාදිලිය අතර ඇති වෙනස්කම් මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

## II කොටස

04. 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා එහි ප්‍රතිඵල පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

05. (I) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන් විධායක කාරක සභා ක්‍රමය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10)
    (II) සෝල්බරි ආණ්ඩුක්‍රමයට එල්ල වූ විවේචන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සාපේක්ෂව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් සිදුකළ වෙනස්කම් පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.
    (I) දෝෂාභියෝග ක්‍රියාදාමය (ලකුණු 10)
    (II) ජාතික ලැයිස්තු ක්‍රමය (ලකුණු 10)
    (III) ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල (ලකුණු 10)

## III කොටස

08. ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් බව විචාරක පිළිගැනීමයි. ඔබ මෙයට එකඟවන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 20)

09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    (I) නිරාගමිකවාදය
    (II) ගැටුම් ජීවන චක්‍රය
    (III) රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිලබල ක්‍රමය
    (IV) ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයෝ
    (V) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක (ලකුණු $10 \times 2 = 20$)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**13 ශ්‍රේණිය**

# තෙවන වාර පරීක්ෂණය - 2023

**පිළිතුරු පත්‍රය**

## දේශපාලන විද්‍යාව

### පළමුවන පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (2) | 2 - (1) | 3 - (4) | 4 - (5) | 5 - (1) | 6 - (3) | 7 - (2) | 8 - (4) | 9 - (4) | 10 - (1) |
| 11 - (5) | 12 - (3) | 13 - (3) | 14 - (5) | 15 - (1) | 16 - (4) | 17 - (2) | 18 - (3) | 19 - (3) | 20 - (4) |
| 21 - (4) | 22 - (5) | 23 - (3) | 24 - (5) | 25 - (5) | 26 - (1) | 27 - (3) | 28 - (2) | 29 - (1) | 30 - (5) |

(2 x 30 = 60)

31. (1) ව්‍යවහාරික ඥානයක් ලෙස බලන අවබෝධය හා සවිඥානකත්වය
    (2) ශාස්ත්‍රිය ලෙස හැදෑරීම
32. (1) රාජ්‍යය
    (2) සිවිල් සමාජය
33. (1) කාල් මාක්ස් (2) ෆෙඩ්‍රික් එංගල්ස්
34. (1) ග්‍රීක පෞර රාජ්‍යය (2) සමාජවාදී රාජ්‍යය
35. (1) ජනාධිපති ආණ්ඩුක්‍රමය/ ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමය
    (2) සහ සන්ධීය ආණ්ඩුක්‍රමය
36. (1) නිෂේධනීය නිදහස (2) රාජ්‍ය නිර්බාධවාදය
37. (1) නිරාගමිකවාදය (2) සමූහාණ්ඩුවාදය
38. (1) මනෝ විද්‍යාත්මක ක්‍රියාමාර්ග
    (2) සමාජීය ක්‍රියාමාර්ග
    (3) දේශපාලන ක්‍රියාමාර්ග යන ඒවායින් දෙකක් සඳහන් කළ යුතු ය.
39. (1) 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය
    (2) මහා ලේකම්/ ප්‍රධාන ලේකම්/ නීති ලේකම්/ මුදල් ලේකම් යන තිදෙනාගෙන් දෙදෙනෙකු සඳහන් කළ යුතුය.
40. (1) 15 යි. (2) 37 යි.
41. (1) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
    (2) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
42. (1) අගමැතිගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරවරයා විසින් 15 දෙනෙකු පත් කිරීම
    (2) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් 15 දෙනෙකු පත් කිරීම.
43. (1) අර්ථවත්භාවය/ තරගකාරීත්වය/ නිදහස/ රහස්‍යභාවය/ සාධාරණත්වය/ නිතර මැතිවරණ පැවැත්වීම/ අන්තහ්කරණය/ සමානාත්මතාවය යන ඒවායින් දෙකක් සඳහන් කළ යුතු ය.
44. (1) 1803 මාර්බරි එරෙහිව මැඩිසන් නඩු තීන්දුව
    (2) එංගලන්තය/ ස්කොට්ලන්තය/ උතුරු අයර්ලන්තය/ වේල්සය යන ඒවායින් දෙකක් සඳහන් කළ යුතු ය.
45. ව්‍යවස්ථාදායකය/ විධායකය / අධිකරණය යන ඒවායින් දෙකක් සඳහන් කළ යුතු ය.
46. (1) ජනාධිපතිවරයා (2) අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලය
47. (1) 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
    (2) 30 දෙනෙකි.
48. (1) ලංකා සමසමාජ පක්ෂය (2) සමගි පෙරමුණ
49. (1) ජාතික රාජ්‍ය හා අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන
    (2) රාජ්‍ය නොවන ක්‍රියාධරයින්
50. (1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ ලෝක බැංකුව (ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව) ආසියානු සංවර්ධන බැංකුව/ ලෝක වෙළඳ සංවිධානය යන ඒවායින් දෙකක් සඳහන් කළ යුතු ය.

## II පත්‍රය

### I කොටස

01. • දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරමින් ප්‍රවේශය ලබාගත හැකි ය.

- ග්‍රීක යුගයේ සිට නූතන යුගය දක්වා මෙහි විෂය ක්ෂේත්‍රය රාජ්‍යය හා ආණ්ඩුව හැදෑරීම වටා කේන්ද්‍රගත වූ බව දක්වමින් පිළිතුරු ගොඩනැගීම.
- වර්තමානය වන විට විෂය ක්ෂේත්‍රය උප විෂය ක්ෂේත්‍රයන් පහකින් යුක්ත බව දක්වා ඒවා කෙටියෙන් විස්තර කිරීම එනම් දේශපාලන දර්ශනය, දේශපාලන මතවාද, දේශපාලන න්‍යාය දේශපාලන ආයතන හා තුලනාත්මක දේශපාලනයයි.
- මෙය ගතික විෂයක්වන නිසා අනාගතයේදී විෂය ක්ෂේත්‍රය ද වෙනස්කම් වන බවට දක්වමින් පිළිතුර අවසන් කිරීම.

02 (I) • දේශපාලන පැතිකඩ යන්නෙහි අදහස පැහැදිලි කරමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- දේශපාලන පැතිකඩෙහි අංශ 5 එනම්, දේශපාලන ආයතන, දේශපාලන භාවිත, ආණ්ඩුකරණය, දේශපාලන චර්යාව, දේශපාලන මතවාද යන ඒවා කෙටියෙන් විස්තර කිරීම.

(II) • දේශපාලනය හැදෑරීම යන්නෙහි අර්ථය හැඳින්වීම.

- දේශපාලනය හැදෑරීම ආකාර දෙකකට සිදු වේ.

එනම්: 1. ව්‍යවහාරික ලෙස 2. ශාස්ත්‍රීය ලෙස

මෙම ආකාර දෙක ප්‍රමාණවත් පරිදි විස්තර කළ යුතු ය.

03 • ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය මාදිලියේ පදනම සහ සමාජවාදී රාජ්‍යයක පදනම පෙන්වා දෙමින් පිළිතුරට ප්‍රවේශය ලබාගත යුතු ය.

- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ පවතින නිදහස් වෙළඳපොල ආර්ථික ක්‍රමය සමාජවාදී රාජ්‍යයක පවතින ආර්ථික හා දේශපාලන ක්‍රමය සමග සංසන්දනය කළ යුතු ය. එහිදී රාජ්‍යයේ මධ්‍යගත සුලසුම් ක්‍රමය හා දේශපාලන නිදහස යන කරුණු ද අවධානයට ලක් කල යුතු වේ.

වර්තමානය වන විට සමාජවාදී රාජ්‍යය ක්‍රමය දුර්වල වී ඇති බවත් ලිබරල් ආර්ථික ක්‍රමය ද විවේචනයට ලක්ව ඇති බවත් නිගමනය කළ හැකි ය.

### II කොටස

04 • 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ පසුබිම හා අරමුණු පැහැදිලි කරමින් පිළිතුරට ප්‍රවේශය ලබාගත හැකි ය.

- විලියම් කෝල්බෲක් සහ සී. එච්. කැමරන් ඉදිරිපත් කළ ආර්ථික, දේශපාලන, සමාජීය, අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා සඳහන් කිරීම හා ඒවායෙහි යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල පිළිබඳව අවධානය යොමු කිරීම.
- සමස්ථයක් ලෙස මෙම ප්‍රතිසංස්කරණය මගින් ශ්‍රී ලංකාව පෙර පැවති ආර්ථික, දේශපාලන හා සමාජීය ක්‍රමය පරිවර්තනයට බඳුන් විය.

05 (I) • ඩොනමෝර් කොමිෂම විධායක කාරක සභා ක්‍රමයක් හඳුන්වා දීමට බලපෑ හේතු දක්වමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- විධායක කාරක සභාවල සංයුතිය, ධුරකාලය, බලතල හා කාරකසභා ක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ සඳහන් කරමින් පිළිතුරු ගොඩනැගීම. කාරක සභා 7 සඳහන් වීම අවශ්‍ය වේ.

(II) • බ්‍රිතාන්‍යයන් මෙරටට හඳුන්වාදුන් අවසන් ආණ්ඩුක්‍රම ප්‍රකතිසංස්කරණය වන මෙය වෙස්ට්මිනිස්ටර් ආකෘතියට අනුව නිර්මාණය කරන ලද්දක් බව සඳහන් කරමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ දුර්වලතා විස්තර කිරීම
  (1) පූර්ණ නිදහස් ආණ්ඩුක්‍රමයකට නොගැළපෙන ලක්ෂණ පැවති බව පැහැදිලි කිරීම.
  (2) දේශජ ව්‍යවස්ථාවක් නොවීම.
  (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවතිය යුතු ඇතැම් අංග මෙම ව්‍යවස්ථාවේ නොතිබීම.
- විවිධ අවස්ථාවල උත්සාහ කර 1972 දී සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි කළ බව සඳහන් කිරීම.

06 • රාජ්‍ය සේවය හා රාජ්‍ය සේවකයා යන්න හඳුන්වා දෙමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- සෝල්බරි යුගයේ රාජ්‍ය සේවයේ ඉහළ හා පහළ අංශ ක්‍රියාත්මක වූ අයුරු පැහැදිලි කිරීම. මෙහි දී ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම ගැන වැඩි අවධානයක් යොමු කිරීම.
- 1972 ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවා කොමිෂම අහෝසි කර එය කැබිනට් මණ්ඩලයේ පාලනයට යටත් කිරීම. එහිදී රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය හා රාජ්‍ය සේවා විනය මණ්ඩලය විස්තර කිරීම.
- 72 ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අහෝසි කළ බව දැක්වීම.

07 (I) • පාර්ලිමේන්තුව මගින් නියමිත කාලයට පෙර ජනාධිපතිවරයා ඉවත් කිරීමට යොදාගත හැකි ඉතා දුෂ්කර ක්‍රියාවලියක් ලෙස සඳහන් කරමින් දෝෂාභියෝගය පිළිබඳ ව හැඳින්වීම.

පාර්ලිමේන්තුව විසින් නිශ්චිත චෝදනා සඳහන් කරමින් පළමුව දෝෂාභියෝග යෝජනාව කතානායකවරයාට භාර දීම, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමක් පැවැත්වීම, අධිකරණමය ක්‍රියාවලියක් පැවතීම, ආදී වශයෙන් එම ක්‍රියාදාමය විස්තර කළ යුතු වේ.

(II) • 1978 ව්‍යවස්ථාවට ගෙන ආ 14වන සංශෝධනය මගින් ජාතික ලැයිස්තු ක්‍රමය හඳුන්වා දීම. මෙහිදී මන්ත්‍රීවරුන් 29ක් පත් කිරීමට විධිවිධාන යෙදීමත් සමග පාර්ලිමේන්තුවට තෝරගන්නා මුලු මන්ත්‍රීවරුන් ගණන 225 දක්වා වැඩි වීම.

- පාර්ලිමේන්තු මැතිවරණයෙන් ඒ ඒ පක්ෂ සහ කණ්ඩායම් ලබාගත් (මුළු රටින් ම) ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව ජාතික ලැයිස්තු මන්තීධූර 29 බෙදා හරිනු ලැබීම පැහැදිලි කිරීම.
- ජාතික ලැයිස්තු ක්‍රමයේ වාසි සහ අවාසි දක්වමින් පිළිතුරු අවසන් කිරීම.

(III) • 1978 ව්‍යවස්ථාවට අනුව ගොඩනගන ලද ජනරජයේ ජ්‍යෙෂ්ඨතම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. මෙහි සංයුතිය හා තෝරාගන්නා ආකාරය සඳහන් කරමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- පනත් කෙටුම්පත් සම්බන්ධ බලය, මූලික අයිතිවාසිකම් පිළිබඳ බලය, අවසන් අභියාචනාධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ආදිය කෙටියෙන් විස්තර කිරීම.
- අධිකරණයේ ස්වාධීනත්වයේ වැදගත්කම සඳහන් කරමින් පිළිතුර නිම කිරීම.

## III කොටස

08 • ඉන්දියාව මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත ආණ්ඩු 29 කින් සමන්විත රාජ්‍යයකි. ඉන්දියාවේ ඒකීය හෝ සන්ධීය බව ව්‍යවස්ථාව මගින් නිශ්චිතව සඳහන් කර නොමැත.

- ඉන්දියාවේ ලැයිස්තු තුනක් ඔස්සේ බලතල බෙදා තිබීම.
- එරට පවතින ඒකීය ලක්ෂණ ලෙස ඒකීය අධිකරණ ක්‍රමය, ඒකීය පුරවැසි භාවය, සමස්ථ ඉන්දියානු රාජ්‍ය සේවය ජනාධිපතිවරයාගේ හදිසි අවස්ථා බලතල, භූමිය පිළිබඳ අයිතිය මධ්‍යම ආණ්ඩුවට හිමිවීම යනාදිය පෙන්වා දීම.
- ව්‍යවස්ථාව මගින් බලතල බෙදීම, ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය, ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමේ බලය අධිකරණය වෙත පැවරීම, ද්වි මණ්ඩලික ව්‍යවස්ථාදායකය යනාදිය පෙන්වා දීම.
- ඉන්දියාව සාමාන්‍ය අවස්ථාවලදී සන්ධීය වන අතර හදිසි අවස්ථාවල ඒකීය වන බව විචාරක පිළිගැනීමයි.

09 • ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය පිළිබඳ නිර්වචන හා එහි ආරම්භය ගැන කරුණු දැක්වීම.

- ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණ විස්තර කිරීම, එනම් ව්‍යවස්ථානුකූලවාදය, මහජන පරමාධිපත්‍යය, බලතල බෙදීම, සංවරණ හා තුලන ක්‍රමය, නීතියේ ආධිපත්‍යය, මානව අයිතිවාසිකම්, සීමිත ආණ්ඩුව, නිහස් හා සාධාරණ මැතිවරණ, ප්‍රජාවට වගවීම යන ලක්ෂණ ය.
- ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල එතරම් දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග දක්නට නොමැති බවත් යුරෝපා රටවල ඉහළ මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග පවතින බවත් නිගමනය කළ හැකි ය.

10 (I) • දේශපාලනය හා ආගම එකිනෙකින් වෙන්කිරීම පිළිබඳව ඉදිරිපත් වූ මතවාදය නිරාගමිකවාදයයි. මෙහි ආරම්භක පසුබිම සඳහන් කරමින් පිළිතුරට ප්‍රවේශ වීම.

- නිරාගමිකවාදයේ ප්‍රභේද දෙකකි. එනම්,


1. ලිබරල්වාදී නිරාගමිකවාදය     2. සමාජවාදී නිරාගමිකවාදය

එම ප්‍රභේද දෙක විස්තර කිරීම.

නිරාගමිකවාදයේ වැදගත්කම පෙන්වා දෙමින් පිළිතුර අවසන් කිරීම.

(II) ගැටුම් ජීවන චක්‍රය

- පුද්ගලික ගැටුමක සිට අන්තර්රාජ්‍ය ගැටුම් තෙක් බොහෝ ගැටුම්වල එක්තරා පොදු ජීවන චක්‍රයක් පවතින බව දැකගත හැකි ය.
- ඇමරිකානු විද්වතුන් වන ලුවිස් ක්‍රිස්බර්ග්ට අනුව ගැටුම් ජීවන චක්‍රය පහත සඳහන් පරිදි පෙන්වාදිය හැකි ය.




- මෙම ජීවන චක්‍රයේ අවධි කෙටියෙන් විස්තර කිරීම අවශ්‍ය වේ.

(III) • රාජ්‍යයට පැවරුණු වගකීම් මුදාහැරලීම පිණිස මග පෙන්වන මූලෝපායික මාර්ග රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස හඳුන්වයි. පොදු ගැටළු විසඳීම රාජ්‍ය ප්‍රතිපත්තියක අරමුණයි.

- රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියට විවිධ අංශ ඍජුව මෙන්ම වක්‍රව ද සම්බන්ධ වේ. ඒ අතර නිලබල ක්‍රමය වැදගත් සාධකයකි.

නිලබල ක්‍රමය යනු කුමක්දැයි හඳුන්වා තිබීම.

විවිධ සමාජවල පවත්නා අධිකාරී ක්‍රම 3ක් හඳුනාගෙන ඇත. එනම් සාම්ප්‍රදායික, අනුහස් හා නෛතික තාර්කික ක්‍රමයයි.

නිලබල ක්‍රමය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඉදිරිපත් කළ මැක්ස් වේබර් ට අනුව නිලබල සංවිධානයක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පවතී.

(1) ධූරාවලිය (2) ශ්‍රම විභජනය එහිදී ප්‍රධාන වේ.

දේශපාලන අධිකාරියට යටත්ව එහෙත් දේශපාලන වශයෙන් මධ්‍යස්ථව කටයුතු කළ යුතු බව සඳහන් කරමින් පිළිතුර නිම කළ හැකි ය.

(IV) • ජාත්‍යන්තර දේශපාලනය යනු කුමක්දැයි අර්ථකථනය කිරීම.

ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරීන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කිරීම එනම්,

(1) ජාතික රාජ්‍ය හා අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන

(2) අන්තර්ජාතික රාජ්‍ය නොවන ක්‍රියාධරයින්

- මෙයින් පහත සඳහන් අන්තර්ජාතික රාජ්‍ය නොවන ක්‍රියාධරයින් පිළිබඳව කෙටියෙන් විස්තර කළ යුතු වේ.

(1) අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන

(2) බහුජාතික සමාගම්(පාරජාතික සංවිධාන)

(3) කීර්තිමත් පුද්ගලයින්

(4) ත්‍රස්තවාදී කණ්ඩායම්

(V) • විදේශ ප්‍රතිපත්තිය යනු කුමක්දැයි අර්ථකථනය කිරීම.

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන පහත සඳහන් සාධක කෙටියෙන් පැහැදිලි කළ යුතු වේ.

(1) භූ දේශපාලන පිහිටීම

(2) දේශපාලන ආර්ථිකය

(3) සමාජ සංස්කෘතික සාධක

(4) කලාපීය සහ ජාත්‍යන්තර බල තුලනය

(5) පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාෂ

(6) ජන සමාජයේ අපේක්ෂා හා අධිපති දෘෂ්ටීන්

- වර්තමාන ශ්‍රී ලංකාව විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ප්‍රවණතාව වී ඇත්තේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සබඳතා කෙරෙහි කේන්ද්‍රීය අවධානයක් යොමු කිරීමයි.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ශිෂ්‍යත්ව
ඉතිහාසය
2013 - 2022
O/L
2024
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න